④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2406/03 - 2024 ඔක්තෝබර් මස 15 වැනි අඟහරුවාදා - 2024.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය යටතේ වූ නියමය

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ ලිඛිත නීතියට අනුකූලව පිහිටුවා ඇති එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම සඳහා පවත්වන 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විසින් 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වැනි වගන්තිය ප්‍රකාරව මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කළ යුතු වියදම් සීමාවන්, තරග කරන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදුව මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් කර ඇත.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. ඒ. පී. සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඒ. ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 ඔක්තෝබර් මස 15 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේදී ය.

## උපලේඛනය

01. 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කරන එක් පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් සහ අපේක්ෂකයෙකු විසින්, තමන් තරග කරන මැතිවරණ කොට්ඨාසයේ වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි එක් ඡන්දහිමියෙකු වෙනුවෙන් සිය මැතිවරණ වියදම් ලෙස වැයකළ හැකි උපරිම වියදම් සීමාව ඇමුණුම -01 හි (i) ලෙස දක්වා ඇත.

02. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි, එක් ඡන්දහිමියෙකු වෙනුවෙන් වැය කිරීමට නිශ්චය කරන ලද මුදල සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ එකී මැතිවරණ කොට්ඨාශයේ වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි සමස්ත ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව ගුණ කිරීමෙන් ලැබෙන මුදල, එක් පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට, සහ අදාළ පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් හෝ තරග වදින අපේක්ෂකයන් සියලු දෙනාට වැය කළහැකි අවසරලත් මුදල වන අතර එය ඇමුණුම 01 හි (ii) ලෙස දක්වා ඇත.

03. ඒ අනුව, එකී අවසරලත් මුදල නම් වූ මුදලේ;

i. සියයට හැටක (60%) ප්‍රමාණය, අදාළ මැතිවරණ කොට්ඨාසයට එක් පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් හෝ තරග වදින අපේක්ෂක සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන මුදල එක් අපේක්ෂකයෙකුටද (ඇමුණුම - 01 හි (iii))

ii. සියයට තිස් නමයයි දශම පහක (39.5%) ප්‍රමාණයක් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද (ඇමුණුම - 01 හි (iv))

iii. සියයට දශම පහක (0.5%) ප්‍රමාණය, ජාතික ලැයිස්තුවේ අපේක්ෂක සංඛ්‍යාව වන 29න් බෙදීමෙන් ලැබෙන මුදල ජාතික ලැයිස්තුව නියෝජනය කරන එක් අපේක්ෂකයෙකුට ද (ඇමුණුම - 01 හි (v))

ස්වකීය මැතිවරණ වියදම් ලෙස අදාළ මැතිවරණ කොට්ඨාසය සඳහා වැය කළහැකි ය. එක් එක් පක්ෂය තරග කරන මැතිවරණ කොට්ඨාසයට අනුව අවසරලත් මුදල තීරණය වන බැවින් පක්ෂයකට සහ ජාතික ලැයිස්තු අපේක්ෂකයකුට වැය කළහැකි උපරිම වියදම් සීමාව තරග කරන මැතිවරණ කොට්ඨාස ගණන සහ අදාළ අවසරලත් මුදල අනුව තීරණය වේ.

04. මැතිවරණ ප්‍රචාරණ වියදම් ඇතුළත් විගණනය කරන ලද වියදම් වාර්තා මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් (21) ඇතුළත අදාළ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම සහ සෑම අපේක්ෂකයකු විසින්ම සකස් කරනු ලැබ අදාලවන පරිදි පක්ෂ ලේකම්ගේ අත්සන, ස්වාධීන කණ්ඩායම් නායකයාගේ අත්සන සහ අපේක්ෂකයාගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයා විසින් සනාථ කොට අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත භාර දෙනු ලැබිය යුතු ය.

අදාළ වාර්තාවේ,

I. පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හා අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව සහ එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම, එකී දායකත්ව පරිත්‍යාග කරනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග,

II. එකී පරිත්‍යාග, දායකත්ව සිදුකළ තැනැත්තාගේ හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලවල නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කළ බදුකරු හඳුනාගැනීමේ අංකය (TIN අංකය) හෝ ලියාපදිංචි අංකය ද ?

සඳහන් කළ යුතු ය.

මෙම වාර්තාවේ,

(අ) කුමන මාධ්‍යක හෝ වෙනත් ආකාරයක කටයුතු පිළිබඳ වියදම් (ප්‍රචාරණ දැන්වීම්, අත් පත්‍රිකා, ධජ, පතාක, සිතුවම්, ඡායාරූප, දැන්වීම් පත්‍ර පෝස්ටර් ආදී),

(ආ) ගුවන්විදුලි හෝ රූපවාහිනී ප්‍රචාර ;

(ඇ) පුවත්පත්, වාර සඟරා, සමාජ මාධ්‍ය, ඩිජිටල් පුවරු හෝ ඕනෑම ඩිජිටල් මාධ්‍යක හෝ වෙනත් ප්‍රකාශන;

(ඈ) වාහන ධාවනයට ඉන්ධන සැපයීම;

ආදිය සඳහා ගෙවීම් සිදුකළේ ද, නැද්ද යන්න තහවුරු කරන බිල්පත් කුවිත්තාන්සි මෙම සේවාවන් ගෙවීම් රහිතව ලබා ගන්නේ නම් එම සේවාව ලබාගත් තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් කළ යුතු ය.

මෙහිදී,

(අ) ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශය තුළ අපේක්ෂකයන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා සහ,

(ආ) ලිපිද්‍රව්‍ය, දුරකථන හෝ වෙනත් ආකාරයක සන්නිවේදන කටයුතු සඳහා

කරනු ලැබූ වියදම් ඉහත වාර්තාවට ඇතුළත් නොකළ යුතු ය.

05. එම වාර්තා දින 10ක් (දහයක්) ඇතුළත ලැබීමෙන් පසුව එම ප්‍රකාශන ලැබී ඇති බවට සහ එම වාර්තා ප්‍රකාශන යම් තැනැත්තකුට පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය හා වේලාවන් දක්වමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් එක් ජාතික පුවත්පතක හෝ දැන්වීමක් පළ කරනු ලබනු ඇත.

06. ඕනෑම තැනැත්තෙකුට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද යම් ගාස්තුවක් ගෙවීමෙන් පසුව එම වාර්තා ප්‍රකාශවල පිටපතක් ලබා ගත හැකි වේ. අදාළ ගාස්තු ප්‍රමාණය එකී තේරීම්භාර නිලධාරී වෙතින් දැනගත හැකි ය.

07. පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයකු හෝ නියමිත දිනට අදාළ වාර්තා භාර නොදීමෙන් හෝ එකී වාර්තාවල දෝෂ සහිත වීමෙන්, නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු වන අතර, නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ සඳහන් දණ්ඩනයට යටත් කරනු ලබනු ඇත.

08. (1) 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු විසින්,

(අ) යම් රජයේ දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් යම් කොටස් ප්‍රමාණයක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ හිමිකාරීත්වය දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ පූර්ව කාලීන යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වෙතින්;

(ආ) විදේශීය රාජ්‍යකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරනු ලැබූ පුද්ගල මණ්ඩලයකින්;

(ඇ) සෘජුව හෝ වක්‍රව විදේශීය කොටස් හිමිකාරීත්වය සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ පූර්වකාලීන යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද යම් සමාගමකින් ; හෝ

(ඈ) අනන්‍යතාවය හෙළි නොකරන ලද යම් තැනැත්තකුගෙන්;

ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයකු හෝ මැතිවරණ ප්‍රවර්ධනය කිරීමේ හෝ ඊට ඉඩ සැලසීමේ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයකු හෝ ඒ වෙනුවෙන් මුදලින් හෝ ද්‍රව්‍යමය ආකාරයකින් සෘජුව හෝ වක්‍රව ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් පිළිගැනීම හෝ භාර ගැනීම නොකළ යුතු ය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් අපේක්ෂකයකු ඒ මැතිවරණය පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණ ආඥාපනතේ විධිවිධාන අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු කරන අතර, නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සම්බන්ධයෙන් 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පනවනු ලැබ ඇති දණ්ඩනයකට යටත් විය යුතු ය.

ඇමුණුම 01

| අංකය | මැතිවරණ කොට්ඨාසය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | එක් ඡන්දහිමියෙකුට වැය කල හැකි මුදල (රු.) (i) | සමස්ත උපරිම වියදම් සීමාව (රු.) (ii) | තරග වදින අපේක්ෂක සංඛ්‍යාව | එක් අපේක්ෂකයෙකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු.) (iii) | පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු.) (iv) | ජාතික ලැයිස්තු අපේක්ෂකයෙකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු.) (v) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 1,765,351 | 114 | 201,250,014 | 21 | 5,750,000 | 79,493,756 | 34,698 |
| 2 | ගම්පහ | 1,881,129 | 110 | 206,924,190 | 22 | 5,643,387 | 81,735,055 | 35,677 |
| 3 | කළුතර | 1,024,244 | 108 | 110,618,352 | 14 | 4,740,787 | 43,694,249 | 19,072 |
| 4 | මහනුවර | 1,191,399 | 108 | 128,671,092 | 15 | 5,146,844 | 50,825,081 | 22,185 |
| 5 | මාතලේ | 429,991 | 107 | 46,009,037 | 8 | 3,450,678 | 18,173,570 | 7,933 |
| 6 | නුවරඑළිය | 605,292 | 110 | 66,582,120 | 11 | 3,631,752 | 26,299,937 | 11,480 |
| 7 | ගාල්ල | 903,163 | 109 | 98,444,767 | 12 | 4,922,238 | 38,885,683 | 16,973 |
| 8 | මාතර | 686,175 | 109 | 74,793,075 | 10 | 4,487,585 | 29,543,265 | 12,895 |
| 9 | හම්බන්තොට | 520,940 | 111 | 57,824,340 | 10 | 3,469,460 | 22,840,614 | 9,970 |
| 10 | යාපනය | 593,187 | 100 | 59,318,700 | 9 | 3,954,580 | 23,430,887 | 10,227 |
| 11 | වන්නි | 306,081 | 82 | 25,098,642 | 9 | 1,673,243 | 9,913,964 | 4,327 |
| 12 | මඩකලපුව | 449,686 | 110 | 49,465,460 | 8 | 3,709,910 | 19,538,857 | 8,529 |
| 13 | දිගාමඩුල්ල | 555,432 | 113 | 62,763,816 | 10 | 3,765,829 | 24,791,707 | 10,821 |
| 14 | ත්‍රිකුණාමලය | 315,925 | 115 | 36,331,375 | 7 | 3,114,118 | 14,350,893 | 6,264 |
| 15 | කුරුණෑගල | 1,417,226 | 107 | 151,643,182 | 18 | 5,054,773 | 59,899,057 | 26,145 |
| 16 | පුත්තලම | 663,673 | 109 | 72,340,357 | 11 | 3,945,838 | 28,574,441 | 12,472 |
| 17 | අනුරාධපුරය | 741,862 | 110 | 81,604,820 | 12 | 4,080,241 | 32,233,904 | 14,070 |
| 18 | පොළොන්නරුව | 351,302 | 109 | 38,291,918 | 8 | 2,871,894 | 15,125,308 | 6,602 |
| 19 | බදුල්ල | 705,772 | 109 | 76,929,148 | 12 | 3,846,457 | 30,387,013 | 13,264 |
| 20 | මොණරාගල | 399,166 | 110 | 43,908,260 | 9 | 2,927,217 | 17,343,763 | 7,570 |
| 21 | රත්නපුරය | 923,736 | 110 | 101,610,960 | 14 | 4,354,755 | 40,136,329 | 17,519 |
| 22 | කෑගල්ල | 709,622 | 108 | 76,639,176 | 12 | 3,831,959 | 30,272,475 | 13,214 |

EOG 10-0143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.